# සියලුම විභාග අපේකෂකයින් වෙත.

01. සියලුම විභාග අපේක්ෂකයින් ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයීය පාලක සභාව සහ සනාතන සභාව මගින් සම්මත කර ඇති විභාග සහ සාමාන්‍යනීති පද්ධතියකට යටත්ව මෙම විභාගය සඳහා පෙනී සිටිය යුතුය.

02. විභාග ශාලාවට ඇතුලුවීමට අවසර ඇත්තේ විභාගය සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කර ඇති අයදුම් කරුවන් සඳහා පමනි.

03. විශ්වවිද්‍යාලය මඟින් නිකුත්කර ඇති ශිෂ්‍ය වාර්තා පොත විභාගය සඳහා පෙනී සිටින ශිෂ්‍යයින් ලග තබා ගත යුතු අතර විභාය අතර තුර විභාග ශාලාධිපති හෝ ඔහුගේ නියෝජිතයෙකු එය ඉල්ලු විට ඉදිරිපත් කල යුතුය.

04. විභාග ශාලාව තුලට ජංගම දුරකථන, ස්මාර්ට් අත්ඔරලෝසු හෝ වෙනත් විද්‍යුත් මාධ්‍ය රැගෙන යා නොහැකි අතර අවසර ලබා දී ඇති අයිතමයන් පමනක් විනිවිද පෙනෙන බෑගයක දමා රැගෙන යා යුතුය. විභාග ශාලාධිපති හෝ ඔහුගේ නියෝජිතයෙකුට ඕනෑම මොහොතක ඔබව පරීක්ෂා කිරීමේ බලය විශ්වවිද්‍යාලය මඟින් ලබා දී ඇත.

05. පෙනී නොසිටින විෂයන් සඳහා ඉදිරිපත් කරනු ලබන වෛද්‍ය සහතිකය සමග එක් විෂයක් සඳහා රුපියල් 300.00 මුදලක් ගෙවිය යුතුය. ඒ සඳහා අවශ්‍ය වව්චර්ය සහ වෛද්‍ය අයදුම්පත්‍රය http://cdce.rjt.ac.lk/cdce/ වෙබ් අඩවියෙන් භාගත කල හැකිය.

06. නිසි ලෙස සම්පුර්ණකල අයදුම්පත්‍රය අදාල විෂය අවසන් දින සිට දින 14 ක් ඇතුලත නියෝජ්‍ය ලේඛකාධිකාරී, දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යයන මධ්‍යස්ථානය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ යන ලිපිනයට පමනක් එවිය යුතුය.

07. විභාග ප්‍රවේශ පත්‍රයේ සඳහන් විභාග මධ්‍යස්ථානයේ දී පමනක් විභාගය සඳහා පෙනී සිටිය යුතු අතර වෙනත් කිසිදු විභාග මධ්‍යස්ථානයේ දී විභාගය සඳහා පෙනී සිටිමට අවසර ලබා නොදේ.

08. විභාග ප්‍රවේශ පත්‍රයේ යම් ගැටලුවක් ඇත්නම් විභාගයට දින තුනකට පෙර 025 2266946 දුරකථනය අමතා විභාග මධ්‍යස්ථානය වෙනස් කරවා ගත යුතුය.

09. විභාග ප්‍රවේශ පත්‍රය සහතික කරවාගෙන පැමිණිය යුතු අතර විභාග ශාලාධිපති විසින් විභාග ප්‍රවේශ පත්‍රය සහතික කරනු නොලැබේ.

10. විභාග ප්‍රවේශ පත්‍රයක් නොමැතිව හෝ විභාග ප්‍රවේශ පත්‍රය සහතික නොකල අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුලුකර ගනු නොලැබේ.

11. විභාග අක්‍රමිකතා සම්බන්ධව විශ්වවිද්‍යාල මගින් දැඩි දඬුවම් ලබා දෙන බැවින් ඒ සඳහා ඔබගේ අවධානය යොමුකරවන මෙන් දන්වමි.